# මැතිවරණය හා අනාගතය

මහා මැතිවරණය අවසන් වී ඇත. ජනතාව නැවතත් බලරහිත කෙරී ඇත. බටහිර ප්‍රජාතන්ත්‍රවාදය යටතේ ජනතාවට බලය ඇත්තේ පාර්ලිමේන්තුව විසුරුවා හැරි දිනයේ සිට මැතිවරණය පැවැත්වෙන දිනය දක්වා පමණකි. මැතිවරණය අවසන්වීමෙන් පසුව නැවතත් පාර්ලිමේන්තුව විසුරුවන තෙක් ඔවුන්ට බලයක් නැත. අද නැවතත් ඊනියා උපදේශකයෝ හා රාජ්‍ය නොවන සංවිධානවල වැටුප් ලබන සේවකයෝ සිංහලයන්ට විරුද්ධව, රටේ බහුතරයට විරුද්ධව,.ආණ්ඩුව වටකරගැනීමට උත්සාහ දරති. බටහිර රටවල ද මැතිවරණයෙන් පසුව ජනතාවට බලය නැත. අප විසින් මෙතෙක් අනුකරණය කෙරී ඇත්තේ ඔවුන් ය. ඒ වෙනස්කළ යුතුව ඇත. අප රටට නව දේශපාලන සම්ප්‍රදායක් අවශ්‍ය වෙයි. ඒ සම්ප්‍රදාය ගොඩනැගීමට මේ අනගි අවස්ථාවකි. බලය ජනතාව අතම රඳවා ඊනියා උපදේශකයන් හා රාජ්‍ය නොවන සංවිධානවල සේවකයන් ඉවත්කිරීමේ වැඩපිළිවෙළක් වහාම සකස්කරගත යුතු වෙයි. ඒ කළ හැකි එක් අයුරක් නම් පාරදෘශ්‍යභාවය හෙවත් දේශපාලන විනිවිද බව හැකිතාක් වැඩිකිරීම ය. එය ජී එල් පීරිස් මහතාගේ විනිවිද බව වැන්නක් නොවිය යුතු ය. අද ඉන්දියාව සමග කරන සාකච්ඡා ජනතාව දැනගත යුතු ය. අගමැති ධුරයට මහින්ද රාජපක්ෂ මහතා පත්කරගැනීමෙහි දී ඉන්දියාව අනුගමනය කළ ප්‍රතිපත්තිය කුමක් ද? ඉන්දියාවට පළමුව අවශ්‍ය වුයේ කදිරගාමර් මහතා ද? එහෙත් රාජපක්ෂ මහතාට ඉන්දියාව අභිබවා යෑමේ ශක්තියක් තිබුණේ ද? එසේ වුවත් රාජපක්ෂ මහතාට ඉන්දියාව සමග යම් එකඟත්වයකට එමට සිදුවිණි ද? රාජපක්ෂ මහතා අගමැති වීමෙන් පසුව ඉන්දියානු මහා කොමසාරිස්වරයා තකහනියක් ඔහු බැහැදුටුවේ ඇයි? අගමැති ධුරයේ වැඩ භාරගැනීමෙන් පසුව රාජපක්ෂ මහතා ඉන්දියාවේ කාර්යභාරය ගැන විශේෂයෙන් සඳහන් කෙළේ ඇයි? මෙරට දේශපාලනය ගැන උනන්දුවක් දක්වන අයට එවැනි ප්‍රශ්නවලට පිළිතුරු අවශ්‍ය වෙයි.

මෙරට දේශපාලන තීන්දු ගැනෙන්නේ, ප්‍රතිපත්ති සකස්කෙරෙන්නේ ඉහළ තනතුරුවලට පත්වන අයට සමීප පුද්ගලයන්ට අවශ්‍ය අන්දමට මිස අඩුතරමින් බලයට පත්වූ දේශපාලන පක්ෂයට අවශ්‍ය අන්දමට හෝ නො වෙයි. මේ සමීපයෝ තණපත් අතර සැඟවුණු සර්පයෝ වෙති. ඔවුහු බොහෝවිට ජනතාව විසින් බලයට පත්කෙරුණු දේශපාලන පක්ෂයට අයත් නො වෙති. පක්ෂ සාමාජිකයන්ට වඩා මේ සමීපයන්ට උගත්කම ඇතැයි කියැවෙයි. එය එසේ විය හැකි ය. එහෙත් ඔවුන්ට ඇත්තේ මෙරටට සරිලන උගත්කමක් නොව බටහිර රටවල අගුපිලට සරිලන උගත්කමකි. ඔවුන්ගේ උගත්කම කෙතරම් වුව ද බටහිර ප්‍රතිපත්ති සකස්කරන නිල මණ්ඩලවලට ඔවුහු සහභාගි නො කෙරෙති. ඔවුන්ට කළහැක්කේ ඔවුන්ගේ උගත්කමින් අපට දමාගැසීම පමණකි. නැත්නම් බටහිරට සේවයකිරීම ය. ඒ දෙක දෙකක් නොව එකක් ම වන අවස්ථා ද වෙයි.

චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය මෙන් ම මහින්ද රාජපක්ෂ මහතා ද වටකරගැනීමට විජාතික බලවේග හා රාජ්‍ය නොවන සංවිධානවල වැටුප් ලබන සේවකයෝ කටයුතු කරමින් සිටිති. පසුගිය අවුරුදු කිහිපයෙහි රාජපක්ෂ මහතා වටා සිටියේ ගිරුවාපත්තුවේ ජනතාව නොවන බව පැහැදිලි ය. ඒ මහතාට ගිරුවාපත්තුවේ ජනතාව ඡන්දය දෙන්නේ ඒ මහතා වටේ සිටින ඊනියා උපදේශකයන් නිසා නොව ඒ මහතා මහින්ද රාජපක්ෂ නිසා ය. ඩී ඒ රාජපක්ෂ මහතාගේ පුත්‍රයා නිසා ය. ඩි එම් රාජපක්ෂ මහතාගේ ඥාතිපුත්‍රයා නිසා ය. ජෝර්ජ් රාජපක්ෂ මහතාගේ ඥාති සහෝදරයකු නිසා ය. ඒ අතරට ඔහු ද මහින්ද නිසා ය. මේ ඊනියා වැඩවසම් සම්බන්ධයක් නො වෙයි. රාජපක්ෂ නම තිබූ පමණින් ම හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි ජයග්‍රහණය සහතික නොවන බව රාජපක්ෂලා විසින් ම පෙන්වාදෙනු ලැබ ඇත. මහින්ද රාජපක්ෂ ජයග්‍රහණය කරන්නේ ඔහු රාජපක්ෂ මෙන් ම මහින්ද ද නිසා ය. එහෙත් ඔහු වටා සිටින රාජ්‍ය නොවන සංවිධානවල විජාතික බත්බැලයෝ ඔහු ලවා ජාතියට ද්‍රෝහී ක්‍රියා කරවාගැනීමට පිඹුරුපත් සකසති. ගිරුවාපත්තුවේ ජනතාව මේ බත්බැලයන් කවුරුන්දැයි තෝරා බේරාගෙන සිංහල බෞද්ධ ක්‍රමයටම ඔවුන්ට පල නොකියා පලා බේදිය යුතු ය.

මේ ආණ්ඩුව බලයට පත්කරනු ලැබ ඇත්තේ සිංහල බෞද්ධයන් විසිනි. එයින් අදහස් කෙරෙන්නේ සිංහල බෞද්ධයන්ගෙන් අති විශාල බහුතරය සන්ධානයට ඡන්දය දී ඇති බව හා සන්ධානයට ලැබුණු ඡන්දවලින් අති විශාල බහුතරය සිංහල බෞද්ධයන්ගෙන් ලැබී ඇති බව ය. ඒ බව ඡන්දය දී ඇති රටාවන්ගෙන් පැහැදිලි වෙයි. පසුගිය මැතිවරණයෙන් පසුව පොදුජන එක්සත් පෙරමුණට හා ජනතා විමුක්ති පෙරමුණට ලැබුණු ඡන්ද විශ්ලේෂණයකින්

© Prof. Nalin De Silva

පසුව අප කියා සිටියේ එවර සිංහල බෞද්ධ ජනතාව ඡන්දය දී ඇත්තේ පරිවාස ආණ්ඩුවක් සඳහා බව ය. ඒ පක්ෂ දෙකේ එකතුවක් සන්ධානයක් අවශ්‍ය බව ද ඒ දිනවල ම කීවෙමු. එය මෙවර මැතිවරණයට පෙර නිර්මාණයවීම ගැන සතුටුවන අතර ඒ සඳහා පාර කැපූ සිංහල මන්ත්‍රී සන්ධානය හා දේශ හිතෛෂී ජනතා ව්‍යාපාරය ද මෙහි දී සඳහන් කළ යුතු ය. එහෙත් බටහිර ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මකවීමේ දී ජනතාව පැත්තකට විසිවන බවත් සිදුවන්නේ ඔවුන්ට අවශ්‍ය දේ නොවන බවත් මතක තබාගත යුතු ය.

සන්ධානයට සිංහල නොවන්නන්ගෙන් එතරම් ඡන්ද ලැබී නොමැත. සන්ධානයෙන් පත්වී ඇති සිංහල නොවන මන්ත්‍රීවරු මෙන් ම මන්ත්‍රිනියන් ද පත්වී ඇත්තේ සිංහල බෞද්ධයන්ගේ ඡන්දවලිනි. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය තෙරුවන් සරණයි කීමට අමතර ව දෙවි පිහිටයි, අස්වලාම් මලෙයිකුම් ආදී කුමක් කීවත් ඇයට මෙන් ම ඇයගේ පක්ෂයට ද සරණවන්නේ සිංහල බෞද්ධයන් බව අමතකකිරීමට ඇයට ඉඩනොතැබිය යුතු ය. සිංහල බෞද්ධයන් සන්ධානයට ඡන්දය දෙන්නේ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය රනිල් වික්‍රමසිංහ මහතාට වඩා හොඳ නිසා නොව ඇය නායකත්වය දෙන්නේ සිංහලත්වයේ පක්ෂයට වීම නිසා ය. ජනතා විමුක්ති පෙරමුණට අද මෙතරම් බලයක් අත්පත්වී ඇත්තේ එක් පැත්තකින් සමානුපාතික ඡන්ද ක්‍රමය හේතුකොටගෙන ය. අනෙක් පැත්තෙන් ඒ පක්ෂය සිංහල බෞද්ධත්වය (අවිඥානිකව) හා ඒකීය රාජ්‍යය (සවිඥානිකව) වෙනුවෙන් පෙනී සිටි බැවින් ය. පොදුජන එක්සත් පෙරමුණ ඊනියා බලය විමධ්‍යගතකිරීමක් ගැන කතාකරන විට ජනතා විමුක්ති පෙරමුණ ඒකීය රාජ්‍යයක් වෙනුවෙන් පෙනී සිටියේ ය. ජනතා විමුක්ති පෙරමුණට තවමත් රටක සංස්කෘතීන් අතර සමානත්වයක් නැති බව නො තේරෙයි. බ්‍රිතානියේ හෝ ඇමරිකාවේ හෝ ඇංග්ලො සැක්සන් ක්‍රිස්තියානි සංස්කෘතිය විශේෂිත සංස්කෘතිය වෙයි. එහෙත් බටහිරයෝ ඒ බව නො කියති. ඔවුන්ගේ දේශපාලන විද්‍යාඥයෝ අනාගමික රාජ්‍ය ගැන දොඩවති. එහෙත් ඒ රටවල ඇත්තේ ක්‍රිස්තියානි රාජ්‍ය වෙයි. බටහිරයන්ගේ සමාජයීය විද්‍යා පමණක් නොව ඔවුන්ගේ සමස්ත දැනුම ම ක්‍රිස්තියානි වෙයි. එහෙත් ඔවුන් ඒ පෙන්වන්නේ ඊනියා වාස්තවික දැනුමක් ලෙස ය. මගේ ලෝකය හා විද්‍යා කතන්දර මෙන් ම මා විසින් ලියනු ලැබ ඇති වෙනත් ලිපි ද විශේෂයෙන් ම විදුසර පුවත්පතට ලියැවෙන ලිපි, කියැවීමෙන් මේ පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි ය. මෙරට ප්‍රශ්නය අන් කිසිවක් නොව සිංහල බෞද්ධ සංස්කෘතියට එයට හිමි තැන නො ලැබීම ය. මොන තරම් සමාජවාදී යැයි කීව ද කියුබාවේ ද ඇත්තේ ස්පාඤ්ඤයන්ගෙන් උරුමවූ ක්‍රිස්තියානි (කතෝලික) සංස්කෘතියක් වෙයි. චීනයේ ඇත්තේ චීන (කොන්ෆියුෂියස්-ටාඕ- මහායාන බෞද්ධ) සංස්කෘතියක් ය. ඉන්දියාව අනාගමික යැයි මොන තරම් බෙරිහන්දුන්න ද එරට ඇත්තේ හින්දු සංස්කෘතියකි. නේරු පවුල බ්‍රාහ්මණ වාංශිකයන් වුව ද ඉතාලි කතෝලික සම්භවයක් ඇති සෝනියා ගාන්ධි මහත්මියට බලයට පත්වීමට නොහැකිවී ඇත්තේ ද එබැවින් ය. එහෙත් ලංකාවේ පමණක් මේ අමන අනාගමික කතාව රාජ්‍ය නොවන සංවිධානවල හා විශ්ව විද්‍යාලවල කසිකබල් දේශපාලන විද්‍යාඥයන්ගේ පිහිටෙන් බොරු උගතුන්ගේ බොරු උගත්කම රැකදීමට උපකාරීවෙයි. සිංහල, දෙමළ, මුස්ලිම් සමානත්වයක් ඇත්තේ පුද්ගලයන් වශයෙන් මිස සංස්කෘතීන් වශයෙන් නො වෙයි.

මෙවර මැතිවරණයේ දී ඡන්දය දී ඇති ආකාරයෙන් පැහැදිලිවන ප්‍රධාන ම කරුණ නම් එහි දී ආර්ථික ප්‍රශ්නවලට වඩා ජාතිකත්වය, සංස්කෘතිය ආදිය ඉස්මතුවී ඇති බව ය. මෙරට සිංහලයන් සාමාන්‍යයෙන් කොටස් තුනකට බෙදිය හැකි ය. ඒ සිංහල බෞද්ධ, ඕල්කට් බෞද්ධ හා සිංහල ක්‍රිස්තියානි යනුවෙන් ය. සිංහල බෞද්ධයන් සාමාන්‍යයෙන් නාගරික නොවන පෙදෙස්වල දැකගත හැකි ය. ඕල්කට් බෞද්ධයෝ වැඩි වශයෙන් නාගරික පෙදෙස්වල (අර්ධ නාගරික යැයි කීම වඩා උචිත වෙයි) ජීවත්වෙති. සිංහල ක්‍රිස්තියානිහු කොළඹින් උතුරෙහි වෙරළබඩ තීරුවෙහි ප්‍රධාන වෙති. මෙය සාමාන්‍යය පමණ ය. මෙහි ව්‍යතිරේක ඇති බව අමතක නොකළ යුතු ය. සිංහල බෞද්ධයන් නාගරික පෙදෙස්වල ද ඕල්කට් බෞද්ධයන් ටික දෙනකු නාගරික නොවන පෙදෙස්වල ද දැකගත හැකි ය. අපට ඕල්කට් බෞද්ධයන් ගැන කලින් කිහිප වතාවක් ම ලිවීමට සිදුවිය. මතකය අළුත්කරගැනීම සඳහා ඕල්කට් බෞද්ධයන් ගැන නැවතත් වචනයක් දෙකක් කිවයුතු වෙයි. ඕල්කට් බෞද්ධයෝ සමස්තයක් ලෙස ගත්කල සිංහලකම හා බෞද්ධකම වෙන්කරති. ඔවුන්ට සාමාන්‍යයෙන් සිංහලකමට වඩා බෞද්ධකම වැදගත්වෙයි. ඔවුහු ජාත්‍යන්තර බෞද්ධයෝ වෙති. බටහිර අධ්‍යාපනයක් ද ලබා ඇති මොවුහු බොහෝවිට බුදුදහම බටහිර විද්‍යාව සමග සංසන්දනය කරති. ඔවුන්ට අනුව බුදුදහම විද්‍යාත්මක වෙයි. ඔවුහු ඊනියා හේතුවාදීහු වෙති. ඔවුහු අයින්ස්ටයින් රසල් ආදී බටහිර පඬුවන් බුදුදහම අගයමින් කර ඇති ප්‍රකාශ ගැන ආඩම්බරයෙන් කතාකරති. එහෙත් ඔවුහු ඒ පඬිවරුන් සංස්කෘතික වශයෙන් ක්‍රිස්තියානි වූ බව නොදනිති. අයින්ස්ටයින් මොන තරම් ආත්මවාදියකු වී ද යත් ඔහු බටහිර ක්වොන්ටම් භෞතික විද්‍යාව නො

© Prof. Nalin De Silva

පිළිගත්තේ ය. බටහිර ක්වොන්ටම් භෞතික විද්‍යාව ඇතැම් තැනක ආත්මවාදයට පටහැණි වෙයි. ඕල්කට්තුමා ද අවසාන වශයෙන් ගත්කළ ආත්මවාදියෙක් විය. ඔහු බෞද්ධයකුට වඩා පරම විඥානාර්ථවාදියෙක් විය. පරම විඥානාර්ථවාදීහු ආත්මවාදීහු වෙති. ඔවුන් ලංකාවේ දී බෞද්ධ පරම විඥානාර්ථයක් ගැන කතාකළ ද එහි පරස්පරයක් වෙයි. බෞද්ධයකුට පරම විඥානාර්ථවාදියකු වියහැකි නො වෙයි. මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන් මෙන් ම අනගාරික ධර්මපාලතුමා ද පසු කලෙක ඕල්කට්තුමාට විරුද්ධ වූ බව ඕල්කට් බෞද්ධයෝ නොදනිති.

ඕල්කට් බෞද්ධයන්ට සිංහල බෞද්ධ සංස්කෘතිය ගැන එතරම් අවබෝධයක් නැත. මොවුහු බොහෝ විට සිංහල බෞද්ධ සංස්කෘතියෙහි දෙවිවරුන්ට බුද්ධිමය වශයෙන් විරුද්ධ වෙති. ඔවුන් කතරගම නොයන්නේ යැයි මෙයින් නො කියැවෙයි. ඇතැම් ඕල්කට් බෞද්ධයනට බුද්ධිමය වශයෙන් පුනරුත්පත්තිය ද, ඔවුන්ගේ පණ්ඩිත වචනවලින් නම් පුනබ්භවය ද නැත. වාසනාවකට මොවුහු එපමණ නො වෙති. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි විවිධාකාර දෙවිවරු සිටින බවත් ඔවුන්ගෙන් සමහරකු ප්‍රාග් වෛදික යක්ෂ සංස්කෘතියට අයත් බවත් තවත් සමහරකු විජයගෙන් සංකේතවත් වන අර්ධ වෛදිකයන් සමග භාරතයෙන් මෙරටට පැමිණි බවත් ඇතැම් විට මේ දෙවිවරුන් මිශ්‍රවී ඇති බවත් පසු කාලයක මේ දෙවිවරුන් සිංහල බෞද්ධ සංස්කෘතියට අවශෝෂණය කරගෙන ඇති බවත් ඕල්කට් බෞද්ධයෝ නො දනිති. ගණනාත ඔබේසේකර වැනි බටහිර සමාජ විද්‍යාඥයන්ට ද මේ සිංහල බෞද්ධ සංස්කෘතියෙහි දෙවියන්ගේ කාර්යභාරය නොතේරෙන බව පැහැදිලි ය.

සිංහල බෞද්ධයන් වැඩි වශයෙන් වාසය කරන පෙදෙස්වල එක්සත් ජාතික පක්ෂය තමන් 2001 දී ලබාගත් ඡන්ද ප්‍රමාණයෙන් 15 % පමණ නැතිකර ගත්තේ ය. එය සාමාන්‍යයෙන් 6% පමණ වෙනසක් විය. මේ බව හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි මෙන් ම මොනරාගල, අනුරාධපුරය, පොළොන්නරුව ආදී දිස්ත්‍රික්කවල ද දැකගත හැකි විය. එහෙත් මේ තත්ත්වය ඕල්කට් බෞද්ධයන් වෙසෙන ප්‍රදේශවල වෙනස් විය. ඕල්කට් බෞද්ධයන්ට ක්‍රිස්තියානි මූලධර්මවාදීන්ගේ ආගමට හැරවීම් ඇඟට ම දැනුණු ප්‍රශ්නයක් විය. දෙමළ ජාතිවාදයට ද වඩා ඒ ප්‍රශ්නය වැදගත් විය. ඒ ප්‍රශ්නය නොවැදගත් යැයි මෙයින් නොකියැවෙයි. මේ ප්‍රශ්නය පිළිබඳ ව ද අපේ ශක්ති ප්‍රමාණයෙන් කටයුතු කර ඇති බව දන්නෝ දනිති. එය කොළඹ සිට ලියූ ලිපිවලට පමණක් සීමා නොවූ බව ද විවිධ පළාත්වල ඒ සම්බන්ධ රැස්වීම්වලට සහභාගි වූවෝ දනිති. දෙමළ ජාතිවාදය ද බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයෙහි ම අංගයක් බව අප තේරුම්ගත්තේ බොහෝ කලකට පෙර ය. එපමණක් නොව බොහෝ ඕල්කට් බෞද්ධයන් ඉහළින් අගයන බටහිර අධ්‍යාපනය ද අපේ මොළ සෝදන බටහිර ක්‍රිස්තියානි අධ්‍යාපනයක් බව අපි දනිමු. එහෙත් ඕල්කට් බෞද්ධයෝ නොදනිති.

ඕල්කට් බෞද්ධයන් වාසය කරන (අර්ධ) නාගරික පෙදෙස්වල ඡන්දය දීමේ රටාව සිංහල බෞද්ධයන් වෙසෙන ප්‍රදේශවල රටාවෙන් වෙනස්විය. එක්සත් ජාතික පක්ෂයේ ක්‍රිස්තියානි ආධිපත්‍යයට විරුද්ධවූ ඒ පක්ෂයට හිතැතිව සිටි ඕල්කට් බෞද්ධයනට ඡන්දය දීමට ජාතික හෙළ උරුමය නමින් පක්ෂයක් බිහිවිණි. (ඕල්කට් බෞද්ධයන්ගෙන් වැඩි පිරිසක් සාමාන්‍යයෙන් ඡන්දය දෙන්නේ එ ජා පක්ෂයට ය.) සිංහල බෞද්ධයන්ට මෙන් නොව ඕල්කට් බෞද්ධයන්ට ජනතා විමුක්ති පෙරමුණට ඡන්දය දීම බොහෝවිට අසීරු කරුණක් වෙයි. එබැවින් ම ජ වි පෙ සමග සන්ධානගතවූ ශ්‍රී ල නි පක්ෂයට ඡන්දය දීම ද ඔවුන්ට ප්‍රශ්නයක් විය. ඔවුන්ට ජාතික හෙළ උරුමයට ඡන්දය දීම ඉතා පහසු කාර්යයක් විය. ඒ පක්ෂය ඔවුන් සඳහා ම නිර්මාණය කළා වැනි ය. එහෙත් එය එසේ නො වෙයි.  ඒ පක්ෂය බිහිකරනු ලැබුයේ ඒ අරමුණින් නො වෙයි. විශේෂයෙන් ම විජාතික බලවේග ඒ පක්ෂයට ආධාර කෙළේ වෙනත් බලාපොරොත්තු ඇතිව ය. එහෙත් මෙරට දේශපාලනයෙහි කැපී පෙනෙන අංගයක් නම් බටහිර මතිමතාන්තර, ගවේෂණ, සංකල්ප ආදිය මත පදනම් වී කරන කාර්යයන් බොහෝ විට අපේක්ෂාවන්ට වඩා විරුද්ධ ප්‍රතිඵල අත්කර දෙන බව ය. ජාතික හෙළ උරුමය නාගරික පෙදෙස්වල කැඩුයේ වැඩි වශයෙන් ම එ ජා ප ඡන්ද ය. ජාතික හෙළ උරුමය එ ජා පයේ මැතිවරන ආයුධයක් ලෙස ගතහොත්  එය පාරාවළල්ලක් විය. ඒ ගැන අපි පසුව තවදුරටත් සාකච්ඡා කරමු.

සන්ධානය සම්බන්ධයෙන් කිවයුත්තේ එයට ආසන 105ක් ලැබී ඇති බවත් එය ආණ්ඩුවක් ගෙන යෑමට ප්‍රමාණවත් බවත් ය. මේ පාර්ලිමේන්තුවේ වෙනත් කිසිම පක්ෂයක සහාය නැතිව ආණ්ඩු කිරීමේ හැකියාව සන්ධානයට ඇත. තොණ්ඩමන් හෝ වෙනත් අයකුගේ සහාය නැතිව ආණ්ඩුව ගෙන යා හැකි අතර ආණ්ඩුව කඩා දැමීමේ කාර්යය විජාතික බලවේගවලට අත්පත් කර දීමට සන්ධානය සමත්විය යුතු ය.
(මතු සම්බන්ධයි).

© Prof. Nalin De Silva